ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 223 -ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා නාවික හමුදාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පුනරාවර්තන වියදම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාවේ 1202 වැය විෂයයට අදාලව ඉන්ධන සැපයීමේ වියදම රු. 9,703,308,156 ක් වු අතර ඉන් රු.373,986,555 ක් ප්‍රතිපූර්ණයකින් තොරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට ලබාදෙන ඉන්ධන වියදම වන අතර පෙර වර්ෂවලදී මෙන් සමාලෝචිත වර්ෂයේදී ද වෙනත් වැය ශීර්ෂයක වියදමක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ 223 වැය ශීර්ෂය යටතේ ගිණුම් ගත කර තිබුණි.	ආරක්ෂක අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 10 දිනැති අංක MOD/FIN/02/05/03/2024 දරන ලිපියේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපූර්ණයකින් තොරව ඉන්ධන නිකුත් කරන ලදි. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය සඳහා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත රු.300,000,000 ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත. මින් ඉදිරියට වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් නෞකා, යාත්‍රා සහ ආයතන වෙතින් මාසිකව ලබා ගන්නා ඉන්ධන වටිනාකම් සෑම කාර්තුවකට වරක් වැය ශිර්ෂය අතර, ප්‍රතිපාදන මාරු කිරිමට කටයුතු කරන බව කාරුණිකව දැන්වේ.	ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාල ඉන්ධන වියදම් පමණක් 1202 වැය විෂයය යටතේ ගිණුම්ගත කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ බැදීමට එළඹි සියළුම බැදීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) යටතේ දැක්විය යුතු වුවද, 2025 වර්ෂයේ ගෙවීම් වවුචර් නියැදි පරික්ෂාවේදී 2024 වර්ෂයට අදාල එකතුව රු. 711,192,718 ක් වටිනා වවුචර් 157 ක් සඳහා ගෙවීම් කර තිබුණද එය බැරකම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබුණි.	නාවික හමුදාවේ සමස්ත බැදීම් හා බැරකම් ප්‍රකාශය සකස් කිරීමේදී උක්ත නිරීක්ෂණයේ සඳහන් වවුචර් 157 ට අදාල බිල්පත් එම අවස්තාව වන විට පැවති ස්ථානය නිශ්චිතව හඳුනාගැනීමට නොහැකිවීම හේතුවෙන් අදාල වවුචර් 157 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොමැති බව නිරීක්ෂණය වේ.	සමාලෝචිත වර්ෂයට අදාල සියළු බැරකම් මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කළ යුතුය.
(iii)	නාවික හමුදාවේ අධ්‍යක්ෂ (මුදල්) ගේ 2025 පෙබරවාරි 10 දිනැති අංක එන්එච්කිව් / බීඑෆ්/ ඩීඑෆ් /41/2024 දරන ලිපිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ ශේෂ වටිනාකම රු. 659,650,414 ක් බව දක්වා	ඉන්ධන රැස්කිරිම සහ බෙදාහැරීම ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගිණුම් අංක 33 ක් යටතේ ලියාපදිංචි නාවික හමුදා ඉන්ධන පිරවුම්හල් 33 ක් මගින් සිදුකරනු ලබන අතර, එම ඉන්ධන පිරවුම්හල් අදාල බිල්පත් නිරවුල් කිරිමට නාවික හමුදා මුලස්ථානයට යොමු කළ යුතුය. 2024 දෙසැම්බර් 31 දිනට ලැබුණු බිල්පත් සියල්ල වැය සටහන් කර තිබු බැවින් බැදීම් හා බැරකම් ප්‍රකාශයට ඇතුලත් කිරිමට	සමාලෝචිත වර්ෂයට අදාල ඉන්ධන වියදමට අදාල බැරකම් සියල්ල මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කළ යුතුය.

	තිබුණද 2024 දෙසැම්බර් 31 දිනට බැරකම් ප්‍රකාශය තුළ අදාළ වටිනාකම ඇතුළත්ව නොතිබුණි.	බිල්පත් නොතිබී ඇත. ඉදිරි වර්ෂයන්හිදී ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙතින් දෙසැම්බර් 31 දිනට ලබාගන්නා හිඟ මුදල එක් එක් බිල්පත අනුව නොව සම්පූර්ණ වටිනාකමක් ලෙස බැරකම් ප්‍රකාශයට ඇතුලත් කරන බව දැන්වේ.	
(iv)	2023 දෙසැම්බර් 29 දිනැති අයවැය චක්‍රලේඛ අංක 5/2023 හි 02 වගන්තිය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කර දී ඇති ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි වියදම් කළමනාකරණය කරගත යුතු වුවද 2024 වර්ෂයට අදාලව 2025 වර්ෂය තුළ සිදුකරන ලද ගෙවීම් සම්බන්ධ නියැදි පරීක්ෂාවට අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ පුනරාවර්තන වැය විෂයයන් සඳහා රු.2,639,162,863 කින් හා ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා රු. 387,477,247 කින් ශුද්ධ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැරකම් සඳහා එළඹ තිබු බව නිරීක්ෂණය විය.	සාගර කලාපයේ නිරන්තරයෙන් සිදුවන තහනම් මත්ද්‍රව්‍ය ජාවාරම, ආයුධ සහ නීති විරෝධී අයුරින් සිදුවන භාණ්ඩ ජාවාරම්, මිනිස් ජාවාරම, මුහුදු මංකොල්ලකෑම, සාගර දූෂණයන්, නියාමනය නොකරන මසුන් ඇල්ලීම ඇතුළු සමුද්‍ර ආරක්ෂක තර්ජනවලට එරෙහිව නාවික හමුදාව කටයුතු කරයි. අවශ්‍ය ප්‍රතිපාදන ඇතුලත් අයවැය ඇස්තමේන්තුවක් 2024 වර්ෂය සඳහා ඉල්ලුම් කළද සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් පමණක් ලබාදෙන ලදී. නාවික හමුදා මෙහෙයුම් හා පරිපාලන රාජකාරි අඛණ්ඩව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමට පමණක් වැය විෂයක ඉතිරි ප්‍රතිපාදන සිමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගැනීමට අවශ්‍ය වු විට මුදල් රෙගුලාසි 94 (2) සහ 94 (3) මගින් සලසා දී ඇති ප්‍රතිපාදන අනුව ක්‍රියා කර ඇති බව දැන්වේ.	බැරකම් වලට එළඹීමේදී ප්‍රතිපාදන සීමාවන් නොයික්මවන පරිදි බැරකම් ඇතිකරගත යුතුය.
(v)	SA -21 දරණ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව වෙනත් මුලාශ්‍ර මඟින් අග්‍රිම ලැබීම් වටිනාකම රු.4,118,432,741 ක් වුවද, ACA 03 ආකෘතියේ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් වටිනාකම රු.4,421,682,741 ක් වී තිබුණි. ඒ අනුව රු.303,250,000 ක වෙනසක් නිරීක්ෂණය විය.	විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි රු.303,250,000 ක වෙනස භාණ්ඩාගාරය විසින් භාණ්ඩාගාර SA-70 ආකෘතියේ ගිණුම් දෝෂ නිවැරදි කිරීම වෙනුවෙන් තබන ලද සටහන් වල එකතුවද මා විසින් ACA-3 ආකෘතියට ඇතුලත් කිරීම නිසා මෙම දෝෂය ඇති වී ඇත. ඉදිරියේදී ගිණුම් පිළියෙල කිරීමේදී SA-70 හා භාණ්ඩාගාර ශේෂ පිරික්සුම සැසඳීම් කර මෙවැනි අතපසුවීම් මඟහැර ගැනීමට කටයුතු කරමි.	නිවැරදිව භාණ්ඩාගාර ලැබීම් නිවැරදිව මූලා ප්‍රකාශන තුල ඇතුළත් කළ යුතුය.
(vi)	SA -21 දරණ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව වියදම් මඟින් අග්‍රිම පියවීම් වටිනාකම රු. 76,065,969,500 ක් වුවද, ACA 03 ආකෘතියේ වියදම් මඟින් අග්‍රිම පියවීම් වටිනාකම රු. 76,369,219,500 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 303,250,000 ක වෙනසක් නිරීක්ෂණය විය.	විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි රු.303,250,000 ක වෙනස භාණ්ඩාගාරය විසින් භාණ්ඩාගාර SA-70 ආකෘතියේ ගිණුම් දෝෂ නිවැරදි කිරීම වෙනුවෙන් තබන ලද සටහන් වල එකතුවද මා විසින් ACA-3 ආකෘතියට ඇතුලත් කිරීම නිසා මෙම දෝෂය ඇති වී ඇත. ඉදිරියේදී ගිණුම් පිළියෙල කිරීමේදී SA-70 හා භාණ්ඩාගාර ශේෂ පිරික්සුම සැසඳීම් කර මෙවැනි අතපසුවීම් මඟහැර ගැනීමට කටයුතු කරමි.	භාණ්ඩාගාර පියවීම් නිවැරදිව මූලා ප්‍රකාශන තුල ඇතුළත් කළ යුතුය.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ණය ශේෂය රු.601,398,953 වුවද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ණය ශේෂය රු.579,773,327 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම ශේෂයන් අතර රු.21,625,626 ක වෙනසක් පැවතුණි. මෙම වෙනස සම්බන්ධයෙන් සොයා බැලීමට අමාත්‍යාංශය මඟින් පත්කළ කමිටුවේ වාර්තාව අනුව මෙම වෙනස පරීක්ෂා කිරීමට පොත් පත් හා ගිණුම් සාරාංශ නාවික හමුදාව සතුව නොමැති බැවින් භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණය හා අත්තිකාරම් පාලන ගිණුමේ වෙනස එලෙසම පැවතුණි.	නිරීක්ෂණය හා එකඟ වේ. මෙම රු.21,625,625.80 ක ශේෂය කපාහැරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි.	ආරක්ෂක අමාත්‍යාංශය හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී සුදුසු ක්‍රියාමාර්ග ගෙන දෙපාර්තමේන්තු පාලන ගිණුම හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අතර වෙනස ඉවත් කිරීමට කඩිනමින් කටයුතු කල යුතුය.

(ඇ) ගබඩා අත්තිකාරම් ගිණුම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	විෂය අංක 223-02 ට අදාළ සිහිවටන ආදායම් ප්‍රකාශය සකස් කිරීමේදී මෙම ඒකකයෙන් නාවික හමුදාවේ ආදායම් ශීර්ෂයට ඇතුළත් කරන රාජ්‍ය ආදායම රු.650,000,000 අඩුකර නොපෙන්වීම මත සිහිවටන ආදායම් ප්‍රකාශනයට අනුව වසරේ ශුද්ධ ආදායම රු.650,000,000 වැඩියෙන් පෙන්වීම හේතුවෙන් රු.74,166,769 ක ඍණ අගයක් ගත යුතු ශුද්ධ ආදායම වෙනුවට රු.575,833,231 ක ධන අගයක් ශුද්ධ ආදායම දක්වා තිබුණි.	වර්ෂ අවසානයේ රජයේ ආදායම් ශීර්ෂය වෙත මාරු කළයුතු ලාභය කොපමණද යන්න ගණනය කිරීමට වර්ෂ අවසාන ගිණුම සකස් කර අවසාන කළයුතු අතර මාරු කළහැකි ලාභය ගිණුම් සකස්කළ පසු ගණනය වන බැවින් හා ඒ වන විටත් ගිණුම් සකස් කිරීම සිදුකර තිබූ බැවින් අතපසුවීමකින් මාරු කළ ලාභය ශේෂ පත්‍රයට මෙන්ම සිහිවන ආදායම් ප්‍රකාශයට ගැලපීම් කර නොතිබුණි. ඉදිරියේදි ගිණුම් සකස් කිරීමේදී මෙම වැරදි නිවැරදි කරගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	ගබඩා අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාල සිහිවටන ආදායම් ප්‍රකාශයේ රාජ්‍ය ආදායම නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.
(ii)	රාජ්‍ය ආදායම ලෙස ඇතුළත් කළ රු. 650,000,000 ක මුදලට අදාළ හරස් සටහන , ඉදිරියට ගෙනා ලාභ අලාභ ගිණුමට හා	වර්ෂ අවසානයේ රජයේ ආදායම් ශීර්ෂය වෙත මාරු කළයුතු ලාභය කොපමණද යන්න ගණනය කිරීමට වර්ෂ අවසාන ගිණුම සකස් කර	ගබඩා අත්තිකාරම් ගනුදෙනු වලට අදාළව නිවැරදිව ද්විත්ව සටහන් තැබිය යුතු අතර ගිණුම්

	අත්තිකාරම් ගිණුමට නොගැලපීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට පිලියෙළ කළ ශේෂ පත්‍රයේ වගකීම් තුළ අන්තර්ගත ඉදිරියට ගෙනා ලාභ අලාභ ගිණුමේ ශේෂය විය යුතු රු. 17,939,015 වෙනුවට එම ශේෂය රු. 667,939,015 ලෙස නිරූපණය වූ අතර වගකීම් තුළ අන්තර්ගත විය යුතු රු.457,629,435 වූ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.192,370,565 ක වත්කම් ශේෂයක් ලෙසට අන්තර්ගත වී තිබුණි. මේ හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ගබඩා අත්තිකාරම් ගිණුම්වල ශේෂ පත්‍රයේ සමස්ථ වත්කම් හා වගකීම් රු.192,370,565 කින් අධි තක්සේරු වී තිබුණි.	අවසාන කළයුතු අතර මාරු කළහැකි ලාභය ගිණුම් සකස්කළ පසු ගණනය වන බැවින් හා ඒ වන විටත් ගිණුම් සකස් කිරීම සිදුකර තිබූ බැවින් අතපසුවීමකින් මාරු කළ ලාභය ශේෂපත්‍රයට මෙන්ම සිහිවන ආදායම් ප්‍රකාශයට ගැලපීම් කර නොතිබුණි. ඉදිරියේදී ගිණුම් සකස් කිරීමේදී මෙම වැරදි නිවැරදි කරගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	තුළ අන්තර්ගත අගයන්හි නිරවද්‍යතාව ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	223-02 වැය අංකය මඟින් 2024 වර්ෂයට අදාලව නාවික හමුදාවේ ආදායම් ලෙස රු. 650,000,000 ක මුදලක් හරස් සටහන් ඔස්සේ මාරු කර ඇති නමුත් නාවික හමුදාව විසින් ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත **ACA – 05** ආකෘතියෙහි වර්ෂය තුල සිදුකල හර කිරීම් තුල එහි වටිනාකමට හරස් සටහන් යටතට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මුදලින් කළ හර වටිනාකම රු.650,000,000 වැඩියෙන් නිරූපණය කර තිබුණි.	ඉදිරියේදී ගිණුම් සකස් කිරීමේදී මෙම වැරදි නිවැරදි කරගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	එකඟ වී ඇති පරිදි නිවැරදි කිරීමට කටයුතු කල යුතුය.
(iv)	විකුණුම් මත එකතු කල අගය මත බදු පිළිබඳ නියැදි පරීක්ෂාවේදී 2024 අප්‍රේල් 08 දින විකුණුම් ඉන්වොයිස් අනුව එදිනට අදාළ වැට් වටිනාකම රු. 852,086 ක් විය යුතු වුවත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වටිනාකම ගණනයේදී මෙම දිනට අදාළ විකුණුම් මත එකතු කල අගය මත බදු වටිනාකම ලෙස රු.803,961 ක් ලෙස රු.48,125 ක් අඩුවෙන් සැලකිල්ලට ගෙන තිබුණි.	2024 අප්‍රේල් 08 දින ඉදිරිපත් කරන ලද වගුවට අනුව අදාල ඉන්වොයිස් පරීක්ෂා කිරීමේදී ඉන්වොයිස් අංක 733 හි වැට් වටිනාකම රු.72,326 ක් ලෙස නිවැරදිව සටහන් කර ඇති අතර, වගුවට ඇතුලත් කිරීමේදී නිවැරදි වැට් වටිනාකම වෙනුවට රු.24,201 ක් ලෙස අත්වැරදීමකින් ඇතුලත් කර ඇත. ඉදිරියේදී මෙම මුදල නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත එකතු කල අගය මත බදු ගෙවීම් නිසි පරිදි වාර්තා කිරීමට හා නිරවුල් කිරීමට කටයුතු කල යුතුය.

(v)	මූල්‍ය ප්‍රකාශන තුල භාණ්ඩාගාර දත්ත ඉදිරිපත් කිරීම් වල 2024 වර්ෂය සඳහා වාර්ෂික උපරිම හර ශේෂ සීමාව ලෙස ගබඩා අත්තිකාරම් (පුපුරණ ද්‍රව්‍ය) ගිණුමේ රු.457,629,434 ක් ඇතුලත් කල යුතු වුවද එය රු.737,575,826 ක් ලෙස ඇතුළත්කර තිබුණි.	2024 වර්ෂය සඳහා අනුමත සීමාවන් දැක්වීමේදී වර්ෂ අවසානයේ ශේෂය ලෙස දක්වා ඇත්තේ අදාල වර්ෂයේ මුළු හර කිරීම් හා බැර කිරීම් අතර වෙනස වන අතර මින් ඉදිරියට වර්ෂ අවසාන ශේෂය ලෙස මාසික ගිණුම් සාරාංශයේ ශේෂය ඇතුලත් කිරීමට සටහන් කර ගත් බව කාරුණිකව දන්වා සිටිමි.	ගබඩා අත්තිකාරම් (පුපුරණ ද්‍රව්‍ය) ගිණුමේ සීමාවන් නිවැරදිව සටහන් කළ යුතුය.
(vi)	අලෙවි නියෝජිතයින් 17 කගෙන් අයකරගත් එකතුව රු.2,886,505 ක වටිනාකම තුල ඇතුලත් විකුණුම් මත එකතු කල අගය මත බදු වටිනාකම විකුණුම් ගිණුමෙන් එකතු කල අගය මත බදු ගිණුමට ගලපා නොතිබීම මත රු.440,200 කින් 2024 වර්ෂයේ විකුණුම් අධිතක්සේරු වීමත් එම වටිනාකමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කල අගය මත බදු වටිනාකම අඩුවෙන් දැක්වීමත් සිදුව තිබුණි.	අලෙවි කරන ලද ඇමෝනියම් නයිට්‍රේට් තොග සඳහා අදාල ගැනුම්කරුවන් වෙත ලිපි යොමුකර අදාල හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු බවත් දක්වා ඇති අතර ඒ අනුව ගැනුම්කරුවන් මගින් නැවත අයකරගත් මුදල රු.2,886,505 කි. මෙම වටිනාකම තුළ අන්තර්ගත එකතුකල අගය මත බදු වටිනාකම රු. 440,200 ක් පමණ විය.	නිවැරදිව ගණුදෙනු ගිණුම්ගත කල යුතු අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත එකතුකල අගය මත බදු ගෙවීම් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කල යුතුය.

(ඇ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාල මූල්‍ය නොවන වත්කම් (ඒසීඒ - 06) උපලේඛණය අනුව, 2024 දෙසැම්බර් 31 දිනට නාවික හමුදාව සතු නෞකා, යාත්‍රා, බෝට්ටු වටිනාකම ලෙස රු. 29,555,782,322 ක් දක්වා තිබුණද විගණනයට ලබාදී තිබූ උපලේඛනය අනුව එම වටිනාකම රු.32,958,956,068 ක් වූයෙන් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් හා දේපළ පිරියත හා උපකරණ සංචිතය රු. 3,403,173,746 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.	ශ්‍රී ලංකා නාවික හමුදාව සහ වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව සතු නෞකා හා යාත්‍රාවන්ගේ විස්තර විගණන කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලද්දේ වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුවට අයත් නෞකා හා යාත්‍රාවන් හි මෙහෙයුම් කටයුතු හා නඩත්තු කටයුතු මෙන්ම ඉන්ධන ලබා දීම ද නාවික හමුදාව මගින් සිදු කරනු ලබන බැවිනි. මින් ඉදිරියේදි විගණන වාර්ථා හා වෙනත් වාර්ෂික වාර්ථා ඉදිරිපත් කිරීමේදි ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් නෞකා හා යාත්‍රාවන්ගේ තොරතුරු පමණක් ඉදිරිපත් කරන බව කාරුණිකව දැන්වේ.	ගිණුම්ගත කිරීමට කටයුතු කර නොමැති ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් නෞකා හා යාත්‍රා වටිනාකම කඩිනමින් ගිණුම්ගත කර මූල්‍ය නොවන වත්කම් තුල දේපළ පිරියත හා උපකරණ වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කල යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු අංක 1701 - පාඩු හා කපා හැරීම් වැය විෂයය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 8,838,541 ක් මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කරගෙන තිබුණි.	රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ‘බී’ ගිණුම යටතේ දිර්ඝ කාලීනව අය නොවී පවතින ශේෂයන් ගිණුම් හා පොත්පත් වලින් ඉවත් කිරීම වෙනුවෙන් 2024 වර්ෂයට අදාලව වියදම් ඇස්තමේන්තුවට රු.200,000 ක ප්‍රතිපාදන ඉල්ලුම් කළද, ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. වර්ෂය අවසන් වන විට අනුමැතිය ලද අත්හැර දැමීම් වටිනාකම රු. 8,838,541 ක් වූ බැවින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වාචික උපදෙස් අනුව මු.රෙ 66 ට අනුව ප්‍රතිපාදන මාරුකිරීමට කටයුතු කරන ලදී.	නිවැරදිව ඇස්තමේන්තු පිළියෙලකර ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කල යුතු වේ.
(ආ)	වැය විෂයය 2103/18 වැය විෂයය යටතේ අභ්‍යන්තර දූරකතන හුවමාරු ඒකක හා ස්විච් ජාලය යාවත්කාලීන කිරීමට රු.50,000,000 ක ප්‍රතිපාදන වෙන්කර පැවතියද එහි භෞතික ප්‍රගතිය සියයට 53 ක් ව තිබියදී රු.22,772,217 ක් හෙවත් ප්‍රතිපාදනයන් සියයට 45.5 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.	2024 වර්ෂයේ නාවික හමුදාවේ අභ්‍යන්තර දූරකථන හුවමාරු ඒකක සහ ස්විච් ජාලය යාවත්කාලින කිරීම වෙනුවෙන් රු. 50,000,000 ක ප්‍රතිපාදන වැය විෂයය අංක 2103-18 යටතේ වෙන් කරන ලදී. එයින් රු. 23,806,139 ක ප්‍රතිපාදන වර්ෂය තුල උපයෝජනය නොවී පවතින බව නිරීක්ෂණය වූ අතර, එම ප්‍රතිපාදන මගින් රු. 20,772,216 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් නාවික හමුදාවට අත්කර ගත හැකි ප්‍රතිලාභයද සැකිල්ලට ගනිමින් මු.රෙ 66 ට අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත වැය විෂයය 2103-014 වෙත ගැනීම කටයුතු කරන ලදි.	ඇස්තමේන්තු වඩා නිවැරදිව පිළියෙලකර ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කල යුතු අතර වර්ෂය තුල ව්‍යාපෘති ඉටුකිරීමේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවිය යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ ත්‍රිකුණාමලයෙහි නාවික තටාංගනයෙහි නාවික ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා	රු.මිලියන 486.13 ක් 2024 ජුලි 31 දිනට උපයෝජනය කර ඇත. අමතරව රු.මිලියන 740 ක් පමණ ඉදිරි කාලයේදී වැය වන බව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) විසින් දන්වා	ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී වඩාත් නිවැරදිව පිළියෙල කල යුතු අතර කිසියම් වැය

	රු.1,657,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද අවස්ථා 06 කදී රු. 764,865,000 ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 46 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. උක්ත ව්‍යාපෘතිය 2015 මාර්තු මස ආරම්භ කර තිබූ අතර වර්ෂ 10 කට ආසන්න කාලයක් ගත වී තිබුණද ව්‍යාපෘතිය අවසන්ව නොතිබියදී ව්‍යාපෘතිය සඳහා වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.	තිබුණි. රු. මිලියන 430.87 ක් ඉතිරි වන බව නිරීක්‍ෂණය විය. ඇමරිකා එක්සත් ජනපදය විසින් ප්‍රධානයක් ලෙස ලබාදෙන නෞකාවේ වියදම් දැරීමට රු.මිලියන 305 ක ප්‍රතිපාදන අවශ්‍යතාවයක් සහ ඉන්දියානු රජයේ ප්‍රදානයක් ලෙස ලැබීමට නියමිත ටොන් 4000 ක ධාරිතාවයකින් යුතු පාවෙන තටාකාංගන ස්ථාපනය කිරීමේ වියදම් ලෙස රු.මිලියන 76 ක අවශ්‍යතාවයක් පැවතිනි. ඒ සඳහා රු. මිලියන 381 ක් වැය විෂයය 2101-023 සහ 2506-024 වෙත මු.රෙ. 66 ට අනුව මාරු කරන ලදි. අවශ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා ඌණතාවයක් පැවති 2002, 2003, 2102 සහ 2401 යන වැය විෂයන් සඳහා ද මාරු කිරීමට කටයුතු කර ඇත.	ශීර්ෂයකට අදාළව වෙන් කරන ලද මුදල් අදාල වර්ෂය තුළ නිසි කළමනාකරණයකින් යුතුව උපයෝජනය විය යුතුය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
(i)	මුදල් රෙගුලාසි 71 වගන්තිය	-	තනතුරු ඇති කිරීම, තනතුරු ශ්‍රේණිගත කිරීම, අනුමත සේවක සංඛ්‍යාව වැඩි කිරීම, තනතුරුවල පදවි නාමය වෙනස් කිරීම, නව අනුප්‍රමාණ හෝ වැටුප් පරිමාණ වේතන, දීමනා සහ අනෙකුත් පඩිනඩි හා පාරිශ්‍රමික ඇති කිරීම වැනි කරුණු සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ පූර්ව අධිකාරී බලය අවශ්‍යවන	නාවික හමුදාවේ සිවිල් කාර්ය මණ්ඩලයක් අනුමත කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාවයක් ලබාගෙන ඇතත් එම ලියකියවිලි මේ වන විට අස්ථානගතවී ඇති බැවින් ඉදිරිපත් කිරීමට නොහැකි වී	එම ලිපි අස්ථානගත වීම සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදු කර අදාල අනුමැතීන් සහිත ලිපි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

			අතර ඔහු විසින් ඒ සඳහා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකගත්වය ලබාගත යුතු වුවද නාවික හමුදාවේ කටයුතු සඳහා 2,224 ක් වූ සිවිල් කාර්ය මණ්ඩලයක් අනුමත කිරීමට අදාල ලිපි විගණනයට ඉදිරිපත් නොවුණි.	ඇත.	
(ii)	මුදල් රෙගුලාසි 507 වගන්තිය	-	ගබඩා අත්තිකාරම් ගිණුමට අදාල කටයුත්ත සතු ස්ථාවර වත්කම් වල පැවැත්ම හා එකී වත්කම් විෂයයෙහි තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් පිළියෙල කොට වාර්ෂික ගිණුම් සමග විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතුය. නමුත් එවැනි ප්‍රකාශයක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මින් ඉදිරියේදී මු.රෙ.507 ප්‍රකාරව ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාල විෂය භාර නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලද බව කාරුණිකව දන්වමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ආ)	2020 අගෝස්තු 08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 සහ 2024 නොවැම්බර් 06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024	-	නාවික හමුදාව විසින් නාවික හමුදා මාලිමා සත්කාරක සේවාව, නාවික හමුදා ඉන්ධන පිරවුම්හල, තල්මසුන් නැරඹීමේ ව්‍යාපෘතිය හා නාවික කෘෂි ව්‍යාපෘතිය නමින් අරමුදල් 04 ක් පවත්වාගෙන යන අතර එම අරමුදල් 04 ට අදාළව බැංකු ගිණුම් 41 ක් පවත්වාගෙන යනු ලැබේ. මෙම සියළු ව්‍යාපෘති ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ලෙස පවත්වාගෙන යන නමුත් චක්‍රලේඛ ප්‍රකාරව එම අරමුදල් අහෝසිකර ඒවායේ මුදල් ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට හෝ අරමුදල පවත්වාගෙන යාමට සාධාරණ හේතු තිබේ නම් එම අරමුදල් පාර්ලිමේන්තු පනත මඟින් නීතිගත කිරීමට 2025 මැයි මස දක්වා කටයුතු කර නොතිබුණි.	අරමුදල් සම්බන්ධව ගතහැකි ක්‍රියාමාර්ගයන් පිළිබඳ විමසා බැලීම සඳහා 2025 ජනවාරි 31 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේදී සාකච්ඡාවක් පවත්වන ලදී. 2025 පෙබරවාරි 10 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් ලබා දී තිබූ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීම සඳහා පත් කරන ලද විද්වත් මණ්ඩලයක් හරහා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ව්‍යවස්ථාපිත අරමුදල් බවට පරිවර්ථනය කිරීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන කෙටුම්පතට	2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ප්‍රකාර නිකුත්කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 04/2024 ට අනුගතව ව්‍යවස්ථාපිත අරමුදල් ඇතිකිරීමට කටයුතු කළ යුතුය.

				යෝජනාවලියක් සකස් කරමින් පවතී.	
(ඇ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය හා මාර්ගෝපදේශ අංක 13 ප්‍රකාරව සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2. (අ) හා (ආ) වගන්ති	-	ප්‍රසම්පාදනය ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාල ක්‍රමානුගතව විස්තර කරන ලේඛනයක් පිළියෙල කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.	ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාල රාමුවක් ලෙස දක්වා ඇති අතර, මිලදී ගැනීමේ ක්‍රියා වෙන් වෙන්ව පෙන්වා නොතිබුණි. 2025 ප්‍රසම්පාදන සැලැස්ම තුල මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පියවර ක්‍රමානුකූලව ඉදිරිපත් කර ඇත.	චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාල ක්‍රමානුගතව විස්තර කරන ලේඛනයක් පිළියෙල කළ යුතුය.
(ඈ)	2022 දෙසැම්බර් 14 දිනැති 2310/29 දරණ කාර්ය පටිපාටික රීති සම්බන්ධයෙන් වූ අති විශේෂ ගැසට් පත්‍රයෙහි 100 වගන්තිය ප්‍රකාරව	-	රජයේ නිලධරයෙක්, සේවයට වාර්තා කිරීමෙන් පසු එම නිලධරයා වෙත රාජකාරී ලැයිස්තුවද ලිඛිතව භාරදීමට අංශවල හෝ ශාඛාවල ප්‍රධානියා අප්‍රමාදව කටයුතු කළ යුතු වුවද නාවික හමුදාවේ සිවිල් කාර්ය මණ්ඩලයට අයත් ප්‍රාථමික සේවා සණයේ කාර්ය මණ්ඩලය වෙත රාජකාරී ලැයිස්තු ලබා දී නොතිබූ බව නිරීක්ෂණය විය.	ප්‍රාථමික සේවා ගණයට අයත් සේවකයින් නාවික හමුදාවේ විවිධ අංශ වෙත අනුයුක්ත කර ඇති බැවින් අදාල අංශ ප්‍රධානීන් විසින් ප්‍රාථමික සේවා ගණයට අයත් සේවකයින්ගේ රාජකාරී පැවරීම සිදු කරනු ලබයි.	කාර්ය පරිපාටික රීති ප්‍රකාරව ප්‍රාථමික සේවා සනයට අයත් සේවකයින් සඳහා රාජකාරී ලැයිස්තු ලබා දිය යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වන ජේදය හා මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ එම ආයතනයට පැවරෙන නිශ්චිත ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් , ක්‍රියාත්මක කාල රාමුව , අපේක්ෂිත ප්‍රතිදානය හා ප්‍රතිඵලයද ඒ සඳහා වගකිව යුතු පාර්ශවයද ඇතුළත්කළ යුතු නමුත්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි එක්	2024 වර්ෂයේ ඉදිරිපත් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මෙහි විෂමතාවයන් නිවැරදි කර නාවික හමුදාව වෙත පැවරෙන නිශ්චිත ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කරන ලද ක්‍රියාකාරකම්, ක්‍රියාත්මක කාල රාමුව, අපේක්ෂිත ප්‍රතිපාදනයන් හා ප්‍රතිඵලය ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන්ද ඇතුලත් කරමින් 2025 වාර්ෂික	චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම්, ක්‍රියාත්මක කාල රාමුව,අපේක්ෂිත ප්‍රතිදානය හා ප්‍රතිඵලයද ඒ සඳහා වගකිවයුතු පාරශවයද ඇතුළත්ව වාර්ෂික සැලැස්ම පිළියෙල

එක් අංශයට පැවරී ඇති සියලු වගකීම් ක්ෂේත්‍ර හා ඒ යටතේ වන ක්‍රියාකාරකම් නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි.	ක්‍රියාකාරකම් සැලැස්ම ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.	කළ යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් නැගෙනහිර නාවික විධානය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා නාවික තටාකාංගණය සහ විශේෂ යාත්‍රා බලසෙණ මූලස්ථානය යන ගොඩනැගිලි දෙකෙහි ඉදිකිරීම් කටයුතු 2024 දෙසැම්බර් 31 දින වන විට අතරමග නතර වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ගොඩනැඟිලි දෙකෙහි ඉදිකිරීම් සඳහා පිළිවෙළින් රු.388,608,541 ක සහ රු.14,590,616 ක පිරිවැයක් දරා තිබුණි.	ශ්‍රීලංනානෞ තටාකාංගණය දස මහල් නිලධාරී ගොඩනැගිල්ලේ මේ වන විට අදියර I යටතේ සත්වන මහල දක්වා ඉදිකිරීම් කටයුතු සිදුකර භාවිතයට ගන්නා අතරම 2025 වර්ෂය සඳහා නාවික හමුදාවට වෙන්වූ ප්‍රතිපාදන ප්‍රමුඛතාවය මත වෙනත් ඉදිකිරීම් සඳහා වෙන් කිරීම හේතුවෙන් මෙම ඉදිකිරීම තාවකාලිකව නවතා ඇත.	සැලසුම් කළ පරිදි ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර් 0.7051 පමණ වූ ශ්‍රීලංනානෞ තම්බපණ්ණී ආයතනය මඟින් පාලනය වන පරණ පුත්තලම නාවික නිරීක්ෂණ මුරපොළ පිහිටි ඉඩම හා පරණ පුත්තලම නාවික අනුඛණ්ඩය ආසන්නයේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් අංක 196 දරණ නිල නිවාසය නාවික හමුදාවට පවරාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති නමුත් ඒ සඳහා එකගවිය නොහැකි බවට 2022 ඔක්තෝම්බර් 05 දින දැනුම් දී තිබුණද එම ස්ථානයේ නාවික නිරීක්ෂණ මුරපොළ පවත්වාගෙන යමින් තිබුණි.	පරණ පුත්තලම නාවික නිරීක්ෂණ මුරපොල පිහිටි ඉඩම හා පරණ පුත්තලම නාවික අනුඛණ්ඩය ආසන්නයේ අංක 196 දරණ නිළ නිවාසය නාවික හමුදාවට පවරාදීමට එකඟවිය නොහැකි බව 2022 ඔක්තෝබර් 05 දිනැති දුම්රිය සාමාන්‍යාධිකාරීගේ ලිපිය මඟින් දන්වා ඇති බව 2022 නොවැම්බර් 08 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් නාවික හමුදා මූලස්ථානය වෙත දැනුම් දී ඇත.	මෙම නාවික නිරීක්ෂණ මුරපොල පවත්වාගෙන යාම ජාතික ආරක්ෂාවට අත්‍යවශ්‍ය වන්නේ නම් අදාල බලධාරී ආයතන සමග සම්බන්ධීකරණය වී එම ඉඩම නාවික හමුදාව විසින් අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර් 0.1011 පමණ වූ ශ්‍රීලංනානෞ බුවනෙක ආයතනය යටතේ පවතින වලෙයිපාඩු දකුණ 02 පිහිටි ඉඩම 2020 අගෝස්තු 14 දිනැති අංක **PA/**12/**MS/**19/252 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්	ඉඩම් කොටස පවරා දීම සඳහා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය වාර්තාවන් පූනකරී ප්‍රාදේශීය ලේකම් විසින් පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ සමඟ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇති බැවින් පවරා දීමේ කටයුතු කඩිනම් කර දෙන ලෙස	පැවරීම නිර්දේශකර ඇති ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය.

	කළමණාකරන ජෙනරාල්ගේ ලිපිය මඟින් අදාල කොන්දේසිවලට යටත්ව වෙරළ ආරක්ෂක මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලබා දී තිබුණද පවරාගැනීමේ කටයුතු මන්දගාමීව සිදු වෙමින් පැවතුණි.	2024 අප්‍රේල් 16 දිනැති ලිපිය මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් කළ ඉල්ලීමට මේ දක්වා ප්‍රතිචාර ලැබී නොමැත.	
(ඇ)	2024 දෙසැම්බර් 31 දින වන විට නාවික හමුදාව විසින් සිය භුක්තිය සඳහා තාවකාලික එකගතාවයන් ලබා ගැනීමට කටයුතු කරමින් පැවති වෙනත් දෙපාර්තමේන්තු සහ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 404.2386 ක් පමණ විය. ඒ අතරින් හෙක්ටයාර 0.1517 ක් පමණ වූ මයිලඩි පිහිටි ඉඩම, හෙක්ටයාර් 0.1517 ක් පමණ වූ හම්බන්තොට පිහිටි ඉඩම, හෙක්ටයාර 0.8093 ක් පමණ වූ ඔළුවිල් වරාය පිහිටි ඉඩම යන ඉඩම් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භුක්තිය සඳහා තාවකාලික එකඟතාවන් ලැබී නොතිබුණි.	මයිලඩි පිහිටි ඉඩම් කොටස නාවික හමුදාව වෙත ලබා දීමේ වත්මන් ප්‍රගතිය සම්බන්ධයෙන් 2025 ජනවාරි 17 දිනැති ලිපියට මෙම ඉඩම් කැබලි 03 නාවික හමුදාවට පවරාගැනීම සම්බන්ධයෙන් අදාල ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ කටයුතු කරමින් පවතින අතර පසුවිපරම් කටයුතු සිදුකරනු ලැබේ.	භුක්තිය සඳහා කඩිනමින් එකගතාවයන් ලබාගෙන පවරා ගැනීමට කටයුතු කල යුතුය.
(ඇ)	සමස්ත ප්‍රමාණය හෙක්ටයාර් 6.574 ක් වූ ඉඩම් 05 ක් නාවික හමුදාව වෙත පවරා දීමේ කටයුත්ත කඩිනමින් කරදෙන මෙන් 2024 ජූලි හා දෙසැම්බර් මාසවල ඉඩම් කොමසාරිස්වරයාගෙන් ඉල්ලීම් කර තිබුණද ඒ සඳහා මේ දක්වා ප්‍රතිචාර ලැබී නොතිබුණු අතර පසුවිපරම් සිදුව නොතිබුණි.	මෙම ඉඩම් කැබලි 05 සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජෙනරාල් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ කටයුතු කරමින් පවතින අතර පසුවිපරම් කටයුතු ද සිදු කරනු ලැබේ.	අදාල පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදුකර මෙම ඉඩම් කඩිනමින් පවරා ගැනීමට කටයුතු කල යුතුය.
(ඉ)	නාවික හමුදාව විසින් භාවිතා කරනු ලබන සමස්ථ ප්‍රමාණය හෙක්ටයාර් 7.1094 පමණ වූ වරාය අධිකාරියට අයත් ඉඩම් 10 ක නාවික හමුදාවට භුක්තිය සඳහා එකඟතාවය ලබාදෙන ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් 2023 සැප්තැම්බර් 27 දින ඉල්ලීම්කර තිබුණද විගණිත දිනය දක්වා එහි එකඟතාවය ලැබී නොතිබුණි.	වරාය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් පවරාදීමේ ඉල්ලීම ඉටු කල නොහැකි බව දැනුම් දී ඇති බැවින් 2024 මාර්තු මස 19 වන දිනැති ලිපිය මඟින් සාකච්ඡාවක් සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇත.	මෙම කැබලි 10 හි භුක්තිය සඳහා එකඟතාවය ලබා ගැනීමට කටයුතු කල යුතුය.
(ඊ)	නාවික හමුදාවට අයත් ද්‍රව්‍ය, උපකරණ, ලී බඩු උපකරණ, යන්ත්‍ර, පරිගණක උපාංග, වාහනේ කබඩ් හා අල්මාරි වැනි ස්ථාවර වත්කම් අතුරින් මිළදී ගැනීමේ පිරිවැය රු.7,688,721 ක් වූ අයිතම 2024 දෙසැම්බර් 31 දිනට අළුත්වැඩියා කල නොහැකි ගර්හිත තත්ත්වයේ පැවතියද එම භාණ්ඩ නිරවුල් කිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	අළුත්වැඩියා කල නොහැකිව ගර්හිත තත්වයේ පසුවන විෂයයන් නාවික හමුදාවේ ක්‍රියාවලියට අනුව මේ වන විට සුදුස්සක් කිරීමේ ක්‍රියාමාර්ග (පොදු 47) ගැනීමට කටයුතු කර ඇත.	යෝජිත පරිදි සුදුසු ක්‍රියාමාර්ග ගෙන මෙම ගර්හිත වත්කම් නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කල යුතුය.

(ඉ)	ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් නෞකා / යාත්‍රා 03 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට ගර්හිත තත්ත්වයේ පසුවීම හේතුවෙන් අපහරණය කිරීමට තීරණය කර තිබුණද එම කටයුතු අවසන්ව නොතිබුණි.	ගර්හිත තත්වයේ පවතින CG 403 යාත්‍රාව අපහරණය කිරීමට අනුමැතිය ලැබී ඇත. පී 156 සහ පී 173 යාත්‍රා 02 වයඹ නාවික විධානය තුල දීර්ඝ කාලයක් භාවිතා කිරීම සහ යාත්‍රා වල කාර්ය සාධනය අඩුවීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ක්‍රමානුකූලව ඉවත් කිරීමට අධ්‍යයන මණ්ඩලයක් මගින් නිර්දේශ කර ඇත.	CG 403 යාත්‍රාව අපහරණය කිරීමට අදාළ ඉදිරි කටයුතු කඩිනමින් සිදු කල යුතු අතර P 156 හා P 173 යාත්‍රා සඳහා නිසි අනුමැතීන් මත කටයුතු කල යුතුය.

4.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නැගෙනහිර නාවික විධානය යටතේ ක්‍රියාත්මක වන මුලතිවු හි නන්දිකඩාල් කලපුව ආසන්නයේ පිහිටි ශ්‍රීලංනානෞ ගෝඨාභය කඳවුරට අයත් වර්ග අඩි 1350 කින් යුත් **A2, A3, A5, B2, B3, B5, C2, C3, C4** යන මුරකුටි වසර දෙකකට ආසන්න කාලයක සිට රාජකාරීය සඳහා ප්‍රමාණවත් නාවිකයින් නොමැතිවීම මත කඳවුරේ මුර රාජකාරි සඳහා උපයෝජනය නොවී පැවතුණි.	මෙම කඳවුරට අයත් භූමිය අක්කර 671 කින් යුක්ත වේ. මුරකුටි 17ක් කඳවුර වටා පිහිටා ඇති අතර, නාවික පිරිස් වල හිඟතාවය මත දැනට ක්‍රියාත්මක වන්නේ දිවා රාත්‍රී ලෙස මුර කුටි 06 ක්ද රාත්‍රීයෙහි එක් මුර කුටියක්ද පමණි.	කඳවුරෙහි ආරක්ෂාව සහ නාවික නිරීක්ෂණ කටයුතු සඳහා ප්‍රමාණවත් මුරකුටි සංඛ්‍යාවක් උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	නැගෙනහිර නාවික විධානයට අයත් ශ්‍රීලංනානෞ වලගම්බා ආයතනයට අයත් කණිෂ්ඨ නාවික නිවාසය ලෙස යොදාගත් නාවික අනුඛණ්ඩය කල්ලරාව යන ස්ථානයේ පිහිටි වර්ග අඩි 900 ක් පමණ වූ පෙරසවි ගොඩනැගිල්ල ඌණ උපයෝජිතව පැවතුණි.	පිරිස්බල ඌණතාවය හේතුවෙන් භාවිතයේ අවම තත්වයක පවතින අතර මෙම පෙරසවි ගොඩනැගිල්ල ශ්‍රීලංනානෞ වළගම්බා ආයතනයේ සවි කිරීමට රු. 842,338 ක මූලික පිරිවැයක් දැරීමට යෝජිතව පවතී.	නිසි අනුමැතීන් මත අදාල ගොඩනැගිල්ල කඩිනමින් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය.
(ඇ)	දකුණු නාවික විධානයට අයත් ශ්‍රීලංනානෞ රුහුණ ආයතනයට අයත් කාර්යාල හා ගබඩා කාමර ලෙස යොදාගත් ශ්‍රීලංනානෞ රුහුණ තංගල්ල පිහිටි මහල් දෙකකින් සමන්විත ගොඩනැගිල්ලේ ආධාරක කණු අබලන් තත්ත්වයක පැවතීම හේතුවෙන් වර්ග අඩි 3,605 පමණ වූ ඉහල මහල ඌන උපයෝජිතව පැවති අතර ගොඩනැගිල්ල භාවිතයේදී අවදානම්කාරී තත්වයක් පවතින බවට ද කරුණු ඉදිරිපත් වී තිබුණි.	දෙමහල් ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 3,605 ක් ඌණ උපයෝජිතව ඇත (ඉහල මාලය). එසේ වුවද, වර්ග අඩි 2,987 න් යුතු පහල මහල සකස් කර කාර්යාල සහ ගබඩා කාමර පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. දෙමහල් ගොඩනැගිල්ලේ ඉහල මාලය කිසිදු කටයුත්තක් සඳහා භාවිතා නොකරන බව දැන්වේ.	ගොඩනැගිල්ල පිළිසකර කර ඵලදායී ලෙස උපයෝජනය කර ගැනීමට කටයුතු කල යුතුය.

(ඈ)	නැගෙනහිර, බටහිර,උතුරු,උතුරු මැද, දකුණු,වයඹ හා ගිණිකොණ යන නාවික විධානයන්ට අයත් පිළිවෙලින් 15,13,83,06,06,06 හා 08 ක් වශයෙන් වූ මුළු ගොඩනැඟිලි 135 ක වටිනාකම තක්සේරු කිරීමට ප්‍රමාද වීම මත මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණි. මේ අතරින් ගොඩනැගිලි 107 කට අදාළව තක්සේරු වටිනාකම ලබා ගැනීමට 2015 වර්ෂයේදීත්, එක් ගොඩනැගිල්ලකට තක්සේරු වටිනාකම ලබා ගැනීමට 2021 වර්ෂයේදීත් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර තිබුණද ඒ සඳහා මෙතෙක් ප්‍රතිචාර නොලැබීම පිළිබඳ පසු විපරම් සිදුකර නොතිබුණි. ගොඩනැගිලි 27 ක් සඳහා තක්සේරු වටිනාකම ලබා ගැනිමට මෙතෙක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීමක් හෝ සිදුකර නොතිබුණි.	පිළිතුරක් ඉදිරිපත් කර නොතිබුණි.	අදාල ගොඩනැගිලි නිසි පරිදි තක්සේරු කර වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමට කටයුතු කල යුතුය.
(ඉ)	නැගෙනහිර නාවික විධානයේ සැපයුම් හා සේවා දෙපාර්තමේන්තුවට අයත් අමතර කොටස් බෙදා හැරීමේදී SPDC II E, SPDC II L, SPDC III, SPDC IV, DOVARA CES, Lubrion stores, යන ගබඩාවන් තුළ සිදු කල අහඹු තොග පරික්ෂාවේදී එකතුව රු.109,307,836 ක් වූ තොග අවසන් පාරිභෝගිකයා විසින් රැගෙන ගොස් නොමැතිව දීර්ඝ කාලයක සිට ගබඩාව තුළ පැවතුණි. ගබඩාවේ තොග නිකුත් නොකර පැවතීමේ කාල සීමාව වසර 03 ඉක්ම වූ අයිතම 100 ක් ද, වසර 02 ත් 03 ත් අතර පැවති අයිතම 35 ක් හා වසර 01 ත් 02 ත් අතර පැවති අයිතම 250 ක් ද වශයෙන් විය. මේ අනුව වාර්ෂික තොග අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදු නොකිරීම මෙන්ම ගබඩා කළමනාකරණයේ දුර්වලතාද පවතින බව නිරීක්ෂණය විය.	ආර්ථික අර්බුධය හේතුවෙන් මුර සංචාරයෙහි යෙදීම සීමාවූ බැවින්, නෞකා සහ යාත්‍රාවන්හී අළුත්වැඩියාවන් අඩු වූ අතර, එම නිසා SPDC II L, SPDC III, DOVARA, CES යන ගබඩාවන්හී තොගයේ ඇණවුම් කරන ලද අමතර කොටස් බෙදා හැරීමද සීමා විය.වාර්ෂික තොග අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා ගනිමින් ඇණවුම් සිදු කරන ලෙස සියළුම නාවික විධානයන්ට උපදෙස් දී ඇත. එබැවින් ඉදිරියට විෂයන් දීර්ඝ කාලයක් නිකුත් නොවී ගබඩාවන් තුල පැවතීම අවම කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි.	පවත්නා තොග සහ අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන ඇණවුම් සිදු කල යුතු අතර මේ සම්බන්ධ පවතින අභ්‍යන්තර පාලන ක්‍රම නැවත අධ්‍යනය කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඊ)	2023 නොවැම්බර් 19 දින ප්‍රසම්පාදනය කර ලබා ගන්නා ලද රු. 8,513,956 ක මුළු වටිනාකමක් වූ යකඩ තහඩු 258 ක් විගණන දිනය වූ 2025 මාර්තු 04 වන විටත් ලෝහ ගබඩාවේ ගබඩාකර පැවතුණි. මෙම තොග නාවික හා සාගරික විද්‍යා පීඨයට අයත් ආපදා කළමනාකරණ පුහුණු පාසලේ ඉදිකිරීමට යෝජිත ආපදා වර්ධන සිමියුලේටර් ව්‍යාපෘතිය සඳහා ඇණවුම්කර තිබුණි. මේ	අංක ENA/APOE/RCFO/ENG/2023/2143 දරන ලිපිගොණුවට අදාල විෂයයන් නැගෙනහිර නාවික විධානයේ අවශ්‍යතාවයන් වෙනුවෙන් භාවිතයට ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාදී ඇත.	අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන ඇණවුම් කල යුතු අතර මෙම තොග ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය.

	අනුව අවශ්‍යතාවය නිසි පරිදි කළමනාකරණය නොකර භාණ්ඩ ඇණවුම් කිරිම මඟින් රාජ්‍ය මුදල් ඌණ උපයෝජනයට ලක්ව ඇති බව නිරීක්ෂණය වේ.		
(ඉ)	නාවික මහ රෝහලේ ස්ථාපිත රුධිර කාන්දු පෙරන ඒකකයේ ඇති Dialysis යන්ත්‍ර 03 හි වගකීම් කාලය 2023 ජූලි 01 දින සිට අවසන් වී ඇති අතර 2024 මාර්තු 01 වන දින සිට 2025 මාර්තු 31 වන දින දක්වා සේවා ගිවිසුම්ගත වීම සඳහා 2023 දෙසැම්බර් 20 දින වෙන් වෙන් වශයෙන් අළුත්වැඩියා කිරීමේ පත්‍ර යොමුකර ඇති අතර අදාල සේවා ගිවිසුම් ගතවීම 2025 පෙබරවාරි මස වන විටත් සිදුව නොතිබුණි.	සේවා ගිවිසුම අළුත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2023 දෙසැම්බර් 21 දින සිට 2025 පෙබරවාරි 05 වන දින දක්වා අවස්ථා 22 ක් මෙම ලිපි ගොනුව යම් යම් ස්ථාන වලට හුවමාරු වී ඇත. විගණන නිර්දේශය ප්‍රකාරව ඉදිරියේදී සේවා ගිවිසුම්ගත වීම ප්‍රමාද වීම වලක්වා ගැනීමට අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කරනු ලැබේ.	සේවා ගිවිසුම කඩිනමින් අළුත් කිරීමට අවශ්‍ය කටයුතු කාර්යක්ෂම ලෙස සිදුකිරීමට සුදුසු ක්‍රමවේදයක් ඇති කිරීමට කටයුතු කල යුතුය.
(ඊ)	මැදගොඩ බංගලාවේ නවීකරණ කටයුතු සඳහා රු. 6,326,857 ක මුදලක් වියදම් කර ඇති නමුත් මේ වන විට නවීකරණ කටයුතු අතහැර දමා ඇති අතර මෙම නවීකරණ කටයුතු සඳහා මිළදී ගත් රු.1,769,913 ක වටිනාකමකින් යුත් ද්‍රව්‍ය නිෂ්කාර්යව ශ්‍රීලංනානෞ ශිල්ප ආයතනයේ ගබඩා කර තිබුණි. එමෙන්ම මෙම නවීකරණය සඳහා දරන ලද රු.6,326,857 ක වියදමින් රු.1,274,890 ක පිරිවැයක් දරා ජාතික ජල සම්පාදන මණ්ඩලය මඟින් නල ළිදක් ස්ථාපනය කලද ඒ තුළින් ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට අපොහොසත්ව තිබුණි.	ප්‍රතිසංස්කරණය කටයුතු සඳහා මිළදී ගෙන තාවකාලිකව වැඩ නවතා දැමීම නිසා ශ්‍රීලංනානෞ ශිල්ප ආයතනයෙහි තොග වෙනත් ව්‍යාපෘතිවල නඩත්තු කටයුතු හා අළුත්වැඩියා කටයුතු වැනි අනුමත ව්‍යාපෘති සඳහා යෙදවීමටද යෝජනා වී ඇත.	ව්‍යාපෘති සඳහා වෙන්කර ඇති මුදල් ඵලදායී ලෙස වියදම් දැරීමට කටයුතු කළ යුතුය.
(උ)	2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අත්තිකාරම් බී ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය පරිදි නාවික පුද්ගලයන් 47 දෙනෙකුගේ ණය වයස් විශ්ලේෂණය අනුව වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට එකතුව රු. 6,832,530 ක් අය නොවී හිඟ හිට තිබුණි.	නිරීක්ෂණය හා එකග වේ. වර්ෂ 05කට වඩා වැඩි රු. 6,832,530 ක ණය ශේෂය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ඌ)	කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව සේවය හැර ගිය සේවකයින් 41 දෙනෙකු ගෙන් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක සිට රු.5,613,358 ක මුදලක් සහ සේවකයින් 05 දෙනෙකුගෙන් අවුරුදු 05 කට වැඩි කාලයක සිට රු. 399,255 ක මුදලක් වශයෙන් සේවකයන් 46 දෙනෙකු ගෙන් අයවිය යුතු සේවක ණය ශේෂ රු.6,012,613 ක්	සේවකයන් 05 දෙනෙකුගේ අවුරුදු 05 කට වැඩි කාලයක සිට අයවිය යුතු ශේෂය රු.399,255 සමඟ එකඟවේ.	ණය ගිවිසුම් ප්‍රකාර හිඟ ශේෂ අයකර ගැනීමට කඩිනමින් අවශ්‍ය කටයුතු කල යුතුය.

	සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.		
(ඔ)	වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරිමේ පදනම මත ලබාදෙන ලද ඉන්ධන අතුරෙන් පෞද්ගලික ආයතනයකට ලබාදෙන ලද ඉන්ධන වෙනුවෙන් 2025 මැයි මස වන විටත් රු.1,186,954 ක් ප්‍රතිපූර්ණය කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.	2024 දෙසැම්බර් 31 දිනට ලබා ගත් ඉන්ධන සඳහා රු.1,186,954.61 ක් තවදුරටත් අයකර ගැනීමට ඇති අතර, ඒ පිළිබඳ අදාල ආයතනය දැනුවත් කර ඇත.	හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ඕ)	වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වල ව්‍යාපෘති වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික නිලධාරීන් හා නාවිකයන් යෙදවීම පිළිබඳව ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයට අදාලව නාවික හමුදාව විසින් එකී නාවික නිලධාරින් හා නාවිකයන් වෙනුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමෙන් තොරව රු. 369,951,372 ක පමණ පිරිවැයක් වැටුප් ලෙස වැයකර තිබුණි.	මේ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතීන් සහිතව ශ්‍රම දායකත්වයන් ලබා දෙන බැවින් ආරක්ෂක අමාත්‍යාංශය විසින් ශ්‍රම දායකත්වය ලබා දීම වෙනුවෙන් වැටුප් ලබා ගන්නා ලෙස දැනුවත් කර නොමැත.	අදාල මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාලව ජොෂ්ඨ හා තෘතියික මට්ටමින් නාවික හමුදා පුද්ගලයින් 55,000 ක් අනුමත කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට තත්‍ය සේවක සංඛ්‍යාව 42,454 වූ බැවින් ජොෂ්ඨ හා තෘතියික මට්ටමේ පුරප්පාඩු 12,546 ක් නිරික්ෂණය විය. එය සමස්ථ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 22 ක පමණ ප්‍රතිශතයක් විය. ඒ තුළ පුරප්පාඩු වූ ජොෂ්ඨ නාවික හමුදා නිලධාරීන් සංඛ්‍යාව 655 ක් වූ අතර එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 17 ක් පමණ විය. පුරප්පාඩු වූ තෘතියික මට්ටමේ නාවික හමුදා පුද්ගලයින් සංඛ්‍යාව 11,891 ක් වූ බැවින් එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 23 ක් පමණ වී තිබුණි. පුරප්පාඩු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට කටයුතු කර නොතිබුණි.	අනුමත සංඛ්‍යාව 55,000 ක් වුවද, සේවක සංඛ්‍යාව 53,000 නොඉක්මවන පරිදි පවත්වාගෙන යන ලෙස 2019 අගෝස්තු මස 23 වන දිනැති අංක එම්ඕඩී/ ඩීර්එෆ්/ එච්ආර්එම්/ එස්එල්එන්/ පීර්එන්/ 05 දරන ආරක්‍ෂක අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් දන්වා ඇත. කෙටිකාලීන පිළියමක් ලෙස 2024 වර්ෂය සඳහා නිලධාරීන් 169ක් සහ නාවිකයින් 4,000 ක් බඳවා ගැනීමට ඉල්ලා සිටියද ආරක්‍ෂක අමාත්‍යාංශය විසින් නිලධාරීන් 169 ක් සහ නාවිකයින් 2,000 ක් පමණක් බඳවා ගැනීමට අනුමැතිය දෙන ලදී. ඒ අනුව 2025 වර්ෂය සඳහා නිලධාරීන් 200 ක් සහ නාවිකයින් 4,000 ක් බඳවා ගැනීමට යෝජනා සකස් කර අනුමැතිය සඳහා ආරක්‍ෂක අමාත්‍යාංශයට යොමු කර ඇත.	පුරප්පාඩු පිරවීමට හෝ සේවක අවශ්‍යතාවයන් නිසි ලෙස හඳුනාගෙන අනුමත සංඛ්‍යාව සංශෝධනය කිරීමට නිසි අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කල යුතුය.

(ආ)	නාවික හමුදාවට අදාළව ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතීක හා ප්‍රාථමික මට්ටමින් නාවික හමුදා සිවිල් සේවක සංඛ්‍යාව 1,936 ක් අනුමත කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට මුළු තත්‍ය සේවක සංඛ්‍යාව 1,200 ක් වූ බැවින් 736 ක් හෙවත් සියයට 38 ක් පුරප්පාඩුව පැවතුණි. ජ්‍යෙෂ්ඨ, තෘතීයික, ද්විතීක හා ප්‍රාථමික මට්ටම් වලට අදාළ සිවිල් සේවක පුරප්පාඩු ප්‍රතිශතය පිළිවෙලින් සියයට 30,92,50 හා 37 ක් වශයෙන් වූ අතර මෙම තත්ත්වය නාවික හමුදාවට ඉහළ කාර්යසාධනයක් ලබා ගැනීමට බාධාවක් වී තිබුණි.	ද්විතියීක හා තෘතියීක මට්ටමේ තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස දන්වා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම්දී ඇත. කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 පරිදි සියලුම ආයතනයන්හී ප්‍රාථමික සේවා ගණයේ දැනට පවතින සියළුම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් නැවත දැනුම්දෙන තුරු අත්හිටුවීමට කටයුතු කර ඇති බැවින්, නාවික හමුදා සිවිල් කාර්ය මණ්ඩලයේ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකි වී ඇත.	අවශ්‍යතාවයන් නිසි පරිදි සාධාරණීයකර අනුමැතිය ලබාගෙන අදාල පුරප්පාඩු පිරවීමට හෝ අනුමත සිවිල් කාර්ය මණ්ඩලය සංශෝධනයට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට ස්ථිර නොවූ සිවිල් කාර්යමණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව 10 ක් වූ අතර ඔවුන් බඳවා ගැනීම 2018 හා 2019 වර්ෂ වලදී සිදුකර තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට මෙම සේවකයන් වසර 05 කට වඩා වැඩි කාලයක සිට සේවය කණ්ඩනය කරමින් සේවයේ යොදවාගෙන තිබුණි. සිවිල් කාර්යය මණ්ඩලය තුළ සේවකයන් 736 ක පුරප්පාඩු ප්‍රමාණයක් පැවතුන ද මෙකී සේවකයන් වසර 05 ක් මුළුල්ලේ සේවය කණ්ඩනය කරමින් සේවයේ යොදවා ගැනීම ගැටළු සහගත විය.	ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූ.රෙ 95 යටතේ බඳවාගෙන ඇති සිවිල් කාර්ය මණ්ඩලයේ සේවය ස්ථිර කිරීම සඳහා සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOD/ADM/11/01/(I) හා 2025 මාර්තු මස 03 වන දිනැති ලිපිය මගින් අප වෙත දන්වා ඇත.	සිවිල් කාර්ය මණ්ඩලය සඳහා විධිමත් පරිදි බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2020 ඔක්තෝම්බර් 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2020 හි 02(vii) වගන්තිය ප්‍රකාරව කාලීන සේවා අවශ්‍යතාවයන් අනුව අනුමත සේවක සංඛ්‍යාව සඳහා සංශෝධනයන් අවශ්‍ය වන විට විධිමත් සාධාරණීකරණයක්ද සමග කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු වුවද 2024 වර්ෂය අවසාන වන විටත් සංශෝධන සහිත නව කාර්ය මණ්ඩලයක් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අවම තනතුරු සංඛ්‍යාවක් හඳුනාගෙන විධිමත් සාධාරණීකරණයක්ද සමග කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.	චක්‍රලේඛ ප්‍රකාරව සේවා අවශ්‍යතාවන් අනුව අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය.